SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 4

### යේසුස්වහන්සේ කමාවීම උගන්වයි

- පියෙක් සිය පුතුට කමා කරයි
- අප කමාවිය යුතුයි
- යේසුස්වහන්සේ පවිටුන්ට කමාවන සේක

# පියෙක් සිය පුතුට කමා කරයි

## යේසුස්වහන්සේගෙන් කථාන්තරයක්

ආත්මික සත්‍යතාවයන් ඉගැන්වීම සඳහා යේසුස් වහන්සේ බොහෝ විට කෙටි උපමාකථා පැවසූ සේක. එයින් එකක් මෙසේය.

''එක්තරා මිනිසෙකුට පුතුන් දෙදෙනෙක් සිටියහ. බාලයා පියාට කථාකොට: පියාණෙනි ඔබගේ වස්තුවෙන් මට අයිති මගේ කොටස මට දුන් දෙන්න. යයි ඉල්ලිය. එවිට පියා සිය පුතුන් දෙදෙනා අතර සිය ධනය බෙදා දුන්නේය. ටික දිනකට පසු බාලයා ඔහුට ලැබුණු කොටස විකුණා මුදල් ගෙන නිවස හැර ගියේය. ඔහු ඉතා දුර රටකට ගොස් අවකල් ක්‍රියාවෙන් කාලය ගතකොට මුදල් නාස්ති කළේය. මෙසේ ඔහු තමා සන්තක සියල්ල වියදම් කළ පසු ඒ රටෙහි ඉතා දරුණු සාගතයක් පැතිර ගියේය. ඔහුට අග හිඟ කම් ඇතිවිය.

''එබැවින් ඔහු ගොස් එරට වැසියෙකු යටතේ රැකියා වකට බැඳුණේය. ඔහුට ලැබුණු රැකියාව නම් ඌරන් බලාගැනීමයි. ඌරන්ට දෙන කරල් වලින් කුස ගිනි නිවාගන්ට ඔහු කැමති විය. කිසිවෙක් ඔහුට කිසිවක් දුන්නේ නැත. අවසානයේදී සියල්ල තේරුම් ගත් ඔහු තමාටම මෙසේ කියා ගත්තේය. මාගේ පියාගේ වැඩකාරයින්ට පවා ඕනැවටත් වඩා ආහාර තිබියදී මම මෙහි හාමත් වන්නේ මන්ද? මම නැගිට මගේ පියාණන් වෙත යා යුත්තෙමි. ගොස් පියාණෙනි මම දෙවියන්වහන්සේටත් ඔබටත් විරුද්ධව පව් කෙළෙමි. තව දුරටත් ඔබගේ පුත්‍රයා යයි කියන්ටවත් නොවටිමි. එබැවින් ඔබගේ වැඩකාරයෙකු ලෙස මා භාරගත මැනවයි කිය යුත්තෙමි. ඔහු මෙසේ සිතා සිය පියා වෙත ආපසු යන්ට පිටත් විය.

''ඔහු නිවසට එනු දුර තියාම දුටු ඔහුගේ පියා උතුරා යන අනුකම්පාවෙන් ඔහු කරා දිව ඔහු වැළඳ, සිප ගත්තේය. එවිට ඔහු සිය පියා අමතා මෙසේ පැවසීය. පියාණෙනි මම දෙවියන්වහන්සේටත් ඔබටත් විරුද්ධව පව් කෙළෙමි. තව දුරටත් ඔබගේ පුත්‍රයා යයි කියන්ට වත් නොවටිමි.

© ඉංග්‍රීසි 1970 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය.
© සිංහල 1982 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

''නමුත් පියා තම සේවකයන්ට කථා කොට ඉතා හොඳ සළුව වහාම ගෙනැවිත් මොහුට හඳවාපල්ලා. මොහුගේ ඇඟිල්ලේ මුද්දක්ද පාද වල වහන්ද දමා පල්ලා. තර කළ වස්සා මරා භෝජන පිළියෙල කර පල්ලා. අපි කමින් ප්‍රීති වෙමු. මක්නිසාද මේ මාගේ පුත්‍රයා නැසී නැවත ජීවත්ව සිටියි. ඔහු නැතිවී සම්බවී''යයි කීවේය. එසේ ඔවුහු උත්සව පවත්වන්ට පටන් ගත්හ.

මේ කාලය තුල කෙතෙහි සිටි වැඩිමහල් පුතා නිවසට ලංවූ කල තූර්ය නාදයත්, නැටීමත් ඇසී සේවකයෙකුට හඬ ගසා කාරණය විමසීය. එවිට සේවකයා: ඔබගේ සහෝදරයා නැවත ගෙදර ආවේය. ඔහු සුවසේ ගෙදර පැමිණි බැවින් පියා තර කළ වස්සා මරවා මෙසේ උත්සව පවත්වන්නේ යයි' කීවේය. එවිට ඔහු කිපී ගෙදරට ඇතුල්වන්ට නොකැමතිව පිටත සිටියේය. එවිට පියා පිටතට ඇවිත් ගෙට ඇතුල්වන ලෙස ඔහු ගෙන් ඉල්ලා සිටියේය. එවිට ඔහු පියා අමතමින් ''මෙපමණ කාලයක් මම ඔබට වහලෙකු මෙන් සේවය කරමින් සිටිමි. කවදාවත් ඔබට අකීකරු නොවීමි. එසේ වුවත් මාගේ මිතුරන් සමඟ ප්‍රීති වෙන්ට ඔබ මට එළු පැටවෙකු වත් දුන්නේ නැත. නමුත් වෙසඟනන් සමඟ ඔබගේ ධනය නාස්ති කළ මේ පුත්‍රයා පැමිණි විට තරකළ වස්සා මරා උත්සව පවත්වන්නේය'යි කීවේය. පියාද උත්තර දෙමින් 'මාගේ පුත්‍රය ඔබ නිතරම මා සමඟ සිටියේය. මා සන්තක සියල්ලද ඔබගේය. නමුත් ඔබගේ සහෝදරයා නැවත පැමිණි බැවින් අප විසින් ප්‍රීති සන්තෝෂ වන්ට යුතුව තිබුණේය. මක්නිසාද ඔහු නැසී නැවත ජීවත්ව සිටී. ඔහු නැතිවී සම්බවීය''යි කීවේය.



<u>ලූක් 15:11–32</u>

## ඔබේ අභ්‍යාසය සඳහා

1. හිස්තැන් පුරවන්න.

වැදගත්........................සත්‍යතාවයන්

වටහා ගැනීමට මිනිසුන්ට උපකාර කරන

පිණිස යේසුස්වහන්සේ..............කී සේක.

## කථාන්තරයෙන් පාඩම්

උරුමක්කාරකම පවරා දීමේ ක්‍රම දෙකක් වෙයි. එනම් අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ අයිතිකාරයා ජීවත්ව සිටියදීම උරුමක්කාරයන් හට නැගී ඔප්පුවකින් පවරා දීමෙන්ය. තමාගේම කැමැත්තට අනුව ජීවිතය ගතකිරීම සඳහා නිවසින් ඉවත්වී යාමට බාල පුතාට වුවමනා විය. තමාගේ සිතට සරිලන මිතුරන් සපයා ගැනීමට ඔහුට උවමනා වූ අතර පියා හෝ සහෝදරයා තමාට අවවාද කරනවාට නො කැමති විය. මේ නිසා පියා ඔහුගේ උරුම කොටස ඔහුට දුන්නේය. ඔහු නිවසින් පිටත්ව ගියේය.



ඔහු ළඟ මුදල් තිබුණු විට ඔහුට මිතුරන් හිඟ නොවීය. එහෙත් ඔහුට මුදල් හිඟවූ විට මිතුරෝ ඔහුහැර ගියෝය. අවසානයේදී හාමන්ව ඌරන් අතර සිටියදී තමා කළ අඥාණකම ගැන ඔහු වටහා ගත්තේය. ඔහු තමාගේ වැරදි ගැන කණගාටුවී ඒ වරදට කමාව ලැබීම සඳහා වරද පිළිගෙන එය කියා දෙමින් නැවත ගෙදරට හැරී ගියේය. සිය පියා ඔහුව පිළිගෙන රැකියාවක් දෙනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය.

එහෙත් ඔහුගේ පියා ඔහුව ආදරයෙන් පිළිගෙන පවලේ ඔහුට හිමි ස්ථානය නැවතත් ලබා දීම මොන තරම් පුදුමයක්ද ! මේ සැලකිල්ල ලබන්ට ඔහු නුසුදුසුව සිටියත්, ඔහු පව් කළත් පියා ඔහුට ප්‍රේම කළේය.

මෙම උපමා කථාවේ එන පියා අපගේ ස්වර්ගීය පියාණන් වූ දෙවියන් වහන්සේව නියෝජනය කරයි. දෙආකාරයකින් මුලාව ගිය මිනිසුන් දෙකොට්ඨාශයක් පුතුන් දෙදෙනාගෙන් නිදසුන් වෙයි. තමන්ගේ වැරදි ක්‍රියා ගැන තැවී කමාව ලබාගැනීමට දෙවියන්වහන්සේ වෙත ආපසු හැරී එන පව්කාර මිනිසුන් බාල පුත්‍රයා මගින් දක්වෙයි.

වැඩිමලා තමාගේ යහපත් කම ගැන .අහංකාර විය. පියාව අත්හැර ගිය නිසා තම බාල සොහොයුරා ගැන ලැජ්ජා විය. ඔහු පියාට සේවය කළේය. නමුත් ඔහු සැබවින්ම පියාට ප්‍රේම නොකළ බව කිසි ගරු සරුවක් නැති ඔහුගේ වචන වලින් පෙනී යයි. බාලයා ගතින් පියාගෙන් ඈත්ව සිටියා සේ ඔහු සිතින් පියාගෙන් ඈත්ව සිටියේය. තමන්ගේ යහපත් කම් ගැන උදම්ව පාරට්ටු කර ගන්නා අය ඔහු මගින් නිරූපනය වෙයි. තමන්ද දෙවියන්වහන්සේගෙන් කමාව ලැබිය යුතු පව්කාරයන් බව ඔවුන් අවබෝධකර නොගනිති. උඩඟුකම, විවේචනය කිරීම හා සමාව නොදීමේ ගතිය දුර රටක සිටියාවූ සහෝදරයාගේ පාපයට වඩා බරපතල විය හැකිය.

අපි සියළු දෙනාම ස්වර්ගීය පියාණන් වහන්සේට අකීකරුව වැරදි කර ඇත්තෙමු. ස්වර්ගයෙහි තිබෙන උන් වහන්සේගේ අලංකාර විමානයේ ස්ථානයක් ලැබීමට තරම් අප සුදුස්සන් නොවේ. නමුත් අපගේ පාප ස්වභාවයට පිටුපා පව් කමාව පිණිස තමන් වහන්සේ වෙත හැරී එන ලෙස උන්වහන්සේ අපට ආරාධනා කරන සේක.

> පාපයේ කුලිය නම් මරණයයි. නමුත් දෙවියන්වහන්සේගේ නොමිලයේ දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ සදාකාල ජීවනයයි.
> රෝම 6:23

### ඔබේ අභ්‍යාසය සඳහා

2. බාල පුත්‍රයා නිවස හැර ගියේ මක්නිසාද?
   - ... (අ) රකියාවක් කිරීමට.
   - ... (ආ) ජනතාවට සේවය කිරීමට
   - ... (ඇ) ඔහුගේ කැමැත්ත ලෙස ජීවත් වීමට.

3. ඔහු ගෙදර පැමිණියේ මක්නිසාද?
   - ... (අ) තවත් මුදල් ඉල්ලා ගැනීමට
   - ... (ආ) පියාගෙන් සමාව ලබා රැකියාවක් ඉල්ලා ගැනීමට
   - ... (ඇ) ඔහු විසූ නගරය ගැන විස්තර කිරීමට.

4. දෙවියන්වහන්සේගෙන් සමාව අවශ්‍ය කාටද?
   - ... (අ) පව් කළ සියළු දෙනාටම
   - ... (ආ) ඉතා නරක මිනිසුන්ට
   - ... (ඇ) නගර වල ජීවත්වන්නන්ට

5. රෝම 6:23 පදය කට පාඩම් කරන්න.

6. ඔබ පව්කර තිබේද? ඔබට දෙවියන්වහන්සේගෙන් සමාව උවමනාද?........................

7. මෙම වචන කට පාඩම් කරන්න. ''පියාණෙනි මම දෙවියන්වහන්සේට විරුද්ධව පව් කෙළෙමි...තව දුරටත් ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන්ට නොවටිමි.'' බාල පුත්‍රයාගේ මෙම වචන දැන් ඔබට ඔබගේ යාච්ඤාව කරගත හැකිය. ඔබ මොන දෙයක් කර තිබුණත් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන බැවින් ඔබට කමාවී උන්වහන්සේගේ නිවසට ඔබ පිළිගන්නා සේක.

## අපි කමා විය යුතුයි

දෙවියන් වහන්සේගෙන් අපගේ පව් කමා කරවා ගැනීමට උවමනා නම් අපත් අපට වැරදි කරන අයට කමා විය යුතු යයි යේසුස් වහන්සේ ඉගැන්වූසේක. අමනාප කම පාපයක් වෙනවා පමණක් නොව අන් පාපයන්ටද හේතුවක් වන්නේය. අමනාපය-පරුෂකමත් විවේචනයත්, ද්වේශයත් හා දබරයත් සමහර විට මිනීමැරුමත් උපදවයි. අප අපගේ පාපයන්ට ඇලී සිටින තුරු ඒවා කමා කරවා ගැනීමට නුපුළුවන. අපි ඒවා අත්හැර ඒවා ඉවත් කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දිය යුතුයි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක.

> "ඔබ අන්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නේ නම් ඔබගේ පියාණන් වහන්සේත් ඔබගේ වරද කමා නොකරන සේක." මතෙව් 6:15

### ඔබේ අභ්‍යාසය සඳහා

8. කිසිවෙකුගෙන් ඔබට වරදක් වූවාද?
එයට කමාවී එය අමතක කරන්ට දෙවියන් වහන්සේගෙන් උපකාර ඉල්ලන්න.

## යේසුස්වහන්සේ පව්ටුන්ට කමා වන සේක.

යේසුස් වහන්සේ කාරණා දෙකක් සඳහා මෙලොවට පැමිණි සේක.

1. දෙවියන්වහන්සේත් උන්වහන්සේගේ ප්‍රේමය ගැනත් අපට කියා දීමට.
2. අපගේ පාප කමාකරවීම සඳහා අපගේ පාපවල දඩුවම තමන්වහන්සේ වෙත පවරා ගෙන අප වෙනුවට මරණය විඳිමට.



යේසුස්වහන්සේ සියළුම පව් කරුවන් උදෙසා මරණය විඳිමට සිටි බැවින් තමන්ගේ පාපවලට කමාව ඉල්ලා උන්වහන්සේ වෙත පැමිණි අයට කමා කිරීමට උන්වහන්සේට බලය තිබුණි. යේසුස් වහන්සේ බොහෝ පව් කරුවන්ට කමාවී ඔවුන්ගේ ජීවිත මුළුමනින්ම වෙනස් කළ සේක. මෙවැනි එක් අවස්ථාවක් නම් එතුමා දේශනා කරනවා අසා ඇගේ කෘතඥතාවය පෙන්වන්ට ආවාවූ එක් පව්කාර ස්ත්‍රියක්ය. යේසුස් වහන්සේද තම ගෝලයන්ද කෑමකට කැඳවූ සීමෝන්ගේ නිවසට ඇ ගියාය. ඇය යේසුස් වහන්සේගේ පාමුල වැටී ඇගේ පාප ගැන පසුතැවිලිව හැඬුවාය. එවැනි නොමනා ස්ත්‍රියකට යේසුස්වහන්සේ තමන්ගේ පාද ස්පර්ශ කිරීමට ඉඩ දීම ගැන සීමොන් මවිත විය. එවිට යේසුස් වහන්සේ ඔහුට කතා කරමින්

''එක්තරා ණය හිමියෙකුට මිනිසුන් දෙදෙනෙක් ණය වී සිටියහ. එක් කෙනෙක් රුපියල් පන්සියක්ද අනෙකා පණහක්ද ණයව සිටියහ. එම මුදල් ආපසු ගෙවීමට දෙදෙනාටම නුපුළුවන්වූ බැවින් ණය හිමියා දෙදෙනාගේම ණය අවලංගු කළේය. එබැවින් ඔහුට වැඩියෙන් ප්‍රේම කරන්නේ ඔවුන් දෙදෙනාගෙන් කවර තැනැත්තා ද''යි ඇසූ සේක? ''වැඩියෙන් ණයව සිටි තැනැත්තා'' යයි සීමොන් උත්තර දුන්නේය. එවිට යේසුස්වහන්සේ ''ඔබේ පිළිතුර හරිය''යි පවසා ස්ත්‍රිය දෙසට හැරී නැවත සීමොන්ට මෙසේ පැවසිය. ''මේ ස්ත්‍රිය ඔබට පෙනෙනවාද? මම ඔබේ ගෙදරට ආ නමුත් මාගේ පාද සෝදන්ට ඔබ වතුර දුන්නේ නැත. නමුත් මැය ඇගේ කඳුලින් මගේ පාද සේදුවාය. එසේ බොහෝ කොට ප්‍රේමය දක්වීමෙන් බොහෝමයක් වූ ඇගේ පාප කමා කරනු ලැබූ බව ඇය පෙන්නුවාය. ස්වල්ප වශයෙන් කමාව ලැබූ තැනැත්තේ දක්වන්නේ ස්වල්ප ප්‍රේමයක් පමණය.'' යේසුස්වහන්සේ ස්ත්‍රියට කථාකොට ''ඔබගේ පාප කමාකරන ලද්දේය''යයි කී සේක. එවිට කෑමට හිඳ උන් අය ''පව් කමාව පාවා දෙන මොහු කවරෙක්ද''යි තම තමාටම කියා ගත්තෝය. නමුත් යේසුස් වහන්සේ ''ඔබගේ ඇදහිල්ල ඔබ ගැලවූයේය. සමාදානයෙන් යන්න'' යයි ස්ත්‍රියට කී සේක. ලූක් 7:41–50



යේසුස්වහන්සේ කමාව දුන් කල ඒ ස්ත්‍රිය කොතරම් සන්තෝෂ වන්ට ඇද්ද? පරිසිවරයාටත් ඔහුගේ මිතුරන්ටත් ඒ සන්තෝෂයම ලබන්ට පුළුවන්කම තිබුණත් තමන් පව්කාරයින් යයි පිළිගැනීමට ඔවුන් මැලි වූහ. ඔවුන් තමන් ගැනත්, තමන්ගේ යහපත් ක්‍රියා ගැනත් උදම්වූහ.

''පව් කමාව පවා දෙන මොහු කවරෙක්දැයි පරිසිවරුන් ඇසූහ. පව් කමා කරන උන්වහන්සේ කවරෙක්ද? උන් වහන්සේදෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේය. තමන් වෙත පැමිණෙන සියල්ලන්ට උන්වහන්සේ අදත් කමාකරන සේක. අප පව් කරුවන් බව පිළිගෙන එයින් මිදීමට ඕනෑව යාච්ඤාවෙන් අපගේ පව් කියාදෙමින් උන්වහන්සේගේ පාමුලට යන්නේ නම් ''ඔබගේ පව් කමාකරන ලද්දේය. ඔබගේ ඇදහිල්ල ඔබව ගැලවූයේය. සමාදානයෙන් යන්න'' යන උන්වහන්සේගේ හඬ අපේ සිතතුල ඇසිය හැකිවේ.'' යේසුස්වහන්සේගෙන් කමාව ලැබීමෙන් අපට ප්‍රීතියත් සමාදානයත් අළුත් ජීවිතයකුත් ලැබේ.

අනික් අතට පරිසිවරුන් මෙන් අප පව්කාරයන් නොවේ යයි පෙන්වීමට අපට පුළුවන. කොතරම් කාලයක් අපි එසේ කරන්නේද එතරම්ම කාලයක් අපට අපගේ පාපවලට කමාව නොලැබේ. අපි යේසුස්වහන්සේට අපේ පව් කියාදී කමාව ඉල්ලිය යුතුය. සදාකාල ජීවනය ලැබීමට පළමුවෙන් ඔබ ඔබගේ පව් කමාකරගත යුතුය.

## ඔබේ අභ්‍යාසය සඳහා

9. යේසුස්වහන්සේගේ මෙම වචන කටපාඩම් කරන්න. ''ඔබගේ පාප කමා කරන ලද්දේය. ඔබගේ ඇදහිල්ල ඔබ ගැලෙව්වේය. සමාදානයෙන් යන්න.''

10. යේසුස්වහන්සේ ඔබගේ පාප කමාකර තිබේද? ..........................................
උන්වහන්සේට ඊට ස්තුති කරන්න. යේසුස් වහන්සේට මගේ ප්‍රේමය පෙන්වීමට කුමක් කරන්නෙම්ද?''යි සිතන්න.

## ශුභ පැතුම් !

දැන් ඔබ මෙම පාඨමාලාවේ තුනෙන් දෙපංගුවක් සම්පූර්ණ කර තිබේ. මෙම පොත් පිංච පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න. අපි එය ශ්‍රේණිගතකර පස්වන පාඩමත් සමගින් ආපසු ඔබට එවන්නෙමු.

ඔබේ නම: ..................................................

ලිපිනය: ................ .................................

දිස්ත්‍රික්කය: ..............................................

වයස: ................ ස්ත්‍රී පුරුෂ භාවය:.........

සීමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8 හැව්ලොක් පාර කොළඹ 6.

SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

5

## යේසුස්වහන්සේ අප උදෙසා මරණය විඳියි

- යේසුතුමා ගැන කුමන්ත්‍රණයක්
- පාස්කුව
- යේසුතුමා ගෙත්සෙමනේදී
- යේසුතුමාගේ නඩු විභාගය
- යේසුතුමා කුරුස පත්වෙයි
- යේසුතුමා කමාවීම උගන්වයි